සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තුන්වන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## නර්තනය

කාලය පැය 2

නම / විභාග අංකය:

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. සම්ප්‍රදායන් තුනෙහිම දක්නට ලැබෙන සබ නැටුම් විශේෂයකි,
    (i) වන්නම් (ii) ගැමි නැටුම්
    (iii) උඩැක්කි (iv) රබන්

02. ''සොලසා සංබය පළමුව පෙරුම් පිරූ බලයෙන්දා'' මෙය,
    (i) තාලම් කවියකි (ii) කඩතුරා කවියකි
    (iii) සිරසපාද කවියකි (iv) මල් යහන් කවියකි

03. උඩරට ගොඩ සරඹ වල එන දැල සරඹය යනු,
    (i) හයවන ගොඩ සරඹයයි (ii) තුන්වන ගොඩ සරඹයයි
    (iii) හතරවන ගොඩ සරඹයයි (iv) පස්වන ගොඩ සරඹයයි

04. පෙරහැර අවස්ථාවකදී ඇතෙකු කුලප්පු වීම තුළින් ඇතිවන ස්ථායිභාවය නම්,
    (i) උත්සහ (ii) සතුට
    (iii) භය (iv) ශෝක

05. ''ඉසුරු දෙවිඳු වඩින දිනා'' මෙම කවි පදය අයත් වන්නමේ කාල රූපය වන්නේ,
    (i) 3 + 4 (ii) 2 + 4
    (iii) 4 + 4 (iv) 3 + 3

- අංක 06-10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.
  **(පතුරු, ඇදෙන අක්ෂර, දෙවොල්, ද්‍රවිඩ, පහතරට, මුස්ලිම්)**

06. දෙවොල් මඩුවේ ප්‍රධාන වශයෙන් .......................................... දෙවියන් පුද ලබයි.

07. කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා .......................................... නර්තන ශිල්පියෙකි.

08. .......................................... නැටුම ශරීරයට තැලීමේ චලන සහිත ගැමි නැටුමකි.

09. නවරාත්‍රී උත්සවය පවත්වනු ලබන්නේ .......................................... ජනතාවයි.

10. ප්‍රස්ථාර කරනයේදී (- -) යන සංකේතයන් .......................................... නිරූපනය කරයි.

- ප්‍රශ්න අංක 11-15 ප්‍රකාශයන් හරි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද වරහන් තුළ යොදන්න.

11. සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව පහතරට බෙරයේ දිග තුන් වියත් තුන් ගුලකි. ( )
12. ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කරන ලද්දේ එස්. පනීභාරත ගුරුතුමා විසිනි. ( )
13. වලියක් මංගල්‍ය පවත්වනු ලබන්නේ විශ්ණු දේවාලය මුල්කර ගෙනය. ( )
14. ''රත්න දීප ජන්ම භූමි'' යන ගීතය මහගමසේකර ගුරින්ගේ නිර්මාණයක් නොවේ. ( )
15. දේශීය තාල පද්ධතියේ දෙතිතේ ප්‍රභේද හතරක් භාවිත වේ. ( )

- **ප්‍රශ්න අංක 16-20 තෙක් ප්‍රශ්න සඳහා A කොටසේ ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | | B | |
|---|---|---|---|
| 16. | ගැමි නැටුම් | i. | ගොඩ සරඹ |
| 17. | සේරමාන් රජු | ii. | සවරං |
| 18. | මධුරාසිය | iii. | සබරගමු |
| 19. | ගලුකාගම හීන් නිලමේ | iv. | පහතරට |
| 20. | අංග හාරය | v. | භරත |

# නර්තනය - 8 ශ්‍රේණිය

**II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

- **පහත ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුරු සපයන්න.**

01. (i) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා ප්‍රධාන ශාන්තිකර්මය නම් කරන්න.
 (ii) එම ශාන්තිකර්මය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු 02 ක් ලියන්න.
 (iii) ශාන්තිකර්ම හා බැඳි පොදු චාරිත්‍ර දෙකක් නම් කරන්න.
 (iv) උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටල 02 ක් නම් කරන්න.
 (v) උඩරට හෝ පහතරට ශාන්තිකර්මයන්ට අයත් නර්තන අංග 02 ක් ලියන්න.

02. **නර්තන, ගායන, වාදන යන ප්‍රායෝගික ක්‍රියාවලිය ලිඛිතව දැක්වීමේ ක්‍රමවේදය ප්‍රස්තාරකරණයයි.**
 (i) 'ජිං ගත ගෙ ගෙ' යන බෙර පදය නියමිත තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 02)
 (ii) 'මල් ගවසාලා කොන්ඩය බැඳලා ඉන තදකර සළු පැළඳ ගෙනේ' යන කවි පදය නියමිත තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 04)
 (iii) තුරඟා වන්නමේ කස්තිරම නියමිත තිත් රූපයට ප්‍රස්ථාර කරන්න. (ල. 04)

03. **නර්තන කලාව පෝෂණය කිරීමෙහිලා නර්තන ශිල්පින්ගෙන් වන මෙහෙය ඉමහත්ය.**
 (i) නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)
 (ii) කේ. එස් ප්‍රනාන්දු ගුරුතුමා විසින් නිර්මාණය කළ නර්තන අංග 02 ක් ලියන්න. (ල. 04)
 (iii) එක් නර්තන ශිල්පියෙකුගෙන් සිදු වූ මෙහෙය කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

04. **ශ්‍රී දළදා පෙරහැර ලාංකේය දේශයේ ප්‍රෞඪත්වය හා අභිමානය විදහා දක්වන ජාතික උත්සවයකි.**
 (i) දළදා පෙරහැර පැවැත්වීමේ අරමුණු 02 ක් නම් කරන්න. (ල. 02)
 (ii) ඇසල පෙරහැරේ දැකිය හැකි අලංකාර නර්තන අංග 04 ක් නම් කරන්න. (ල. 04)
 (iii) දළදා පෙරහැරේ සංස්කෘතික වටිනාකම අගය කරමින් ලිපියක් සකස් කරන්න (ල. 04)

05. **දක්ෂිණ භාරතයේ පැරණිතම ශාස්ත්‍රීය නෘත්‍ය භරත නාට්‍යම් වේ.**
 (i) භරත නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 02 ක් ලියන්න. (ල. 02)
 (ii) භරත නර්තන සම්ප්‍රදායේ ප්‍රගමනයට දායක වූ තන්ජාවූර් සහෝදරයින් නම් කරන්න. (ල. 04)
 (iii) භරත නාට්‍යම් සම්ප්‍රදායේ භාවිත ඇඳුම් කට්ටලයේ කොටස් 04ක් නම් කරන්න. (ල. 04)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තුන්වන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## නර්තනය

පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (i) | 06. | දෙවොල් | 11. | ✓ | 16. | සවරං |
| 02. | (iii) | 07. | පහතරට | 12. | ✓ | 17. | පහතරට |
| 03. | (i) | 08. | පතුරු | 13. | ✗ | 18. | භරත |
| 04. | (iii) | 09. | ද්‍රවිඩ | 14. | ✓ | 19. | සබරගමු |
| 05. | (iv) | 10. | ඇදෙන අක්ෂර | 15. | ✗ | 20. | ගොඩ සරඹ |

(ල.1×20=20)

### II කොටස

**01.** (i) පහතරට බෙරය (දෙවොල් බෙරය, සෝෂක බෙරය ...)
දෙවොල් මඩු ශාන්ති කර්මය (ල. 02)

(ii) **අතීත අරමුණු**
- ★ සේරමාන් රජුට ඇති වූ දිවි දෝෂය සුවපත් කිරීම සඳහා

**වර්තමාන අරමුණු**
- ★ ලෙඩ රෝග සුවපත් කිරීම සඳහා
- ★ රටට සෞභාග්‍ය උදාකර ගැනීමට
- ★ අධ්‍යාපන අරමුණු මුදුන්පත් කර ගැනීමට
- ★ පර්යේෂණ කටයුතු සඳහා (ල. 02)

(iii) කප් සිටුවීම, තොට පේ කිරීම, මඩු පේ කිරීම ආදි ලෙස ලියා ඇත්නම් (ල. 02)

(iv) උඩරට - වෙස් ඇඳුම් කට්ටලය
පහතරට - දෙවොල් ඇඳුම් කට්ටලය (ල. 02)

(v) උඩරට - අස්නේ, කොහොඹා හැල්ල, ආවැන්දුම ආදි ...
පහතරට - තෙල්මේ, දෙවොල්, පත්තිනි ආදි ... (ල. 02)

**02.** (i)

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| මල් | - | ග | ව | සා | - | ලා | - | කොන් | - | ඩ | ය | බැ | ඳ | ලා | - |
| ඉ | න | ත | ද | ක | ර | ස | එ | පැ | ළ | ද | ගෙ | නේ | - | - | - |

ඉහත ලෙස ප්‍රස්තාර කර ඇත්නම් (ල. 04)

(ii) අදාළ කවියක් නියමිත තිතට ප්‍රස්තාර කර ඇත්නම් (ල. 04)

(iii) කස්තිරම නියමිත තිතට ප්‍රස්තාර කර ඇත්නම් (ල. 04)

03. (i) ආචාර්ය එස්. පනිභාරත, ගලුකාගම හීන් නිලමේ, කේ. එස්. ප්‍රනාන්දු
ආදි ලෙස නම් කර ඇත්නම් (ල. 02)

(ii) එක් ශිල්පියෙකු පිළිබඳ පහත ශීර්ෂ යටතේ විස්තර කර ඇත්නම්

★ ජීවන තොරතුරු ★ සේවය ඇගයීම ★කලා නිර්මාණ (ල. 04)

(iii) ගිරිදේවි නැටුම / සළු පාලිය / රතිරාග වන්නම / සුරඹා වල්ලිය / නාරිලතා කෝලම (ල. 04)

04. (i) **පැවැත්වීමේ අරමුණු**

★ දළදා වහන්සේට උපහාර පිණිස පැවැත්වීම.

★ රටට සෞභාග්‍ය උදාකර ගැනීම

★ කලට වැසි ලබා ගැනීම සඳහා (ල. 02)

(ii) නර්තන අංග 04 ක් නම් කර ඇත්නම් (ල. 04)

(iii) සංස්කෘතික වටිනාකම අගය කිරීමට
කරුණකට ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න. (ල. 04)

05. (i) නිජබිම - දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තය
ආන්ද්‍රා, කේරල, කර්නාටක, මහාරාෂ්ට, මධුරාසිය (ල. 02)

(ii) චින්නයියා / පොන්නයියා / වඩිවේලු / ශිවනාදන් (ල. 04)

(iii) කොණ්ඩා හා මලච්චරම් / උච්චි පට්ටම් / හැට්ටය / වංගි / පිජාමා / තුයියා සේලය
ආදි ලෙස නම් කර ඇත්නම් (ල. 04)

(7) WWW.PastPapers.WiKi (6)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තුන්වන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 08 - 2023

# නර්තනය

ප්‍රායෝගික පරීක්ෂණය

1. (i) කැමති ගායනය (ල. 5)
   (ii) නම් කරන ගායනය
   (සිරසපාද, මල් යහන්, පතුරු, සවරං) (ල. 5)

02. (i) පා සරඹ 7, 8, 9
    සරඹයක් හමාර පදය සමග නර්තනය (ල. 5)
    (ii) ගොඩ සරඹ 5, 6
    එක් සරඹයක් කස්තිරම සමඟ නර්තනය (ල. 5)

03. (i) වෛරොඩි වන්නමේ කවියක් මාත්‍රා දෙකක් සහිතව නර්තනය (ල. 5)
    (ii) කස්තිරම (ල. 5)

04. ගැමි නැටුමක් නර්තනය (පතුරු, සවරං) (ල. 10)

05. **චරිත නිරූපනය**
    සිංහයා, උකුස්සා, නාගයා, මොණරා යන චරිත වලින් එක් චරිතයක් ''භය'' නැමැති ස්ථායි භාවය නිරූපනය වන සේ සිද්ධියක් ගොඩ නගමින් නර්තනය (ල. 10)

PAST PAPERS WIKI
(7) WWW.PastPapers.WiKi (7)

Download Term Test Papers, Short Notes From One Place!



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න